මානවශාස්ත්‍ර අධ්‍යයන, 1999 (1), පිටු 55-65.

# අමරපුර නිකායෙන් ඉස්මතු වූ ජාතික හා ආගමික ප්‍රබෝධය

එස්. ඩී. එන්. ධම්මරත්න

ලක්දිවට බුදු සසුන හඳුන්වාදීමෙන් පසු දේශීය සංඝ සමාජයේ සීඝ්‍ර වර්ධනයක් ඇතිවිය. අනුරාධපුර යුගයේ දී ද භික්ෂු සමාජය නිකාය වශයෙන් බෙදී පැවතියත් එකී වෙනස්කම් රාජධානි මාරුවීමත් සමග අභාවයට ගියේ ය. දහසයවන සියවසේ දී මහනුවර රාජධානියේ ආරම්භවීමත් සමග භික්ෂු සමාජය තුළට අප්‍රතිපත්ති සහ දුෂ්ප්‍රතිපත්ති පිවිසීම නිසා භික්ෂු සමාජය වඩාත් සංකීර්ණ ආගමික සංස්ථාවක් බවට පත්ව තිබිණ. පැවිදි ජීවිතයේ පරිපූර්ණත්වය ලබාගැනීම සඳහා වැඩිවියට පත් සෑම පැවිද්දෙක් විසින් ම සම්පූර්ණ කළ යුතු ආගමික චාරිත්‍රයක් වූ උපසම්පදා කර්මය මහනුවර සමය වන විට පැවිදි සමාජයෙන් ඉවත් වී තිබිණ. උපසම්පදා කර්මය නැවත ඇතිකොට මල්වතු අස්ගිරි නිකාය එක් නිකායක් බවට පත්කිරීම සිදුවූයේ මහනුවර රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ (1747-1782) රාජ්‍ය සමයේ දී ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සියම් දේශයෙන් උපසම්පදාව සහිත උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් වැඩමවා පුනරුත්ථාපනය කරන ලද භික්ෂු සමාජය **ශ්‍යාමෝපාලි මහානිකාය** වශයෙන් හැඳින්විණ.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සියම් නිකාය පිහිටුවා උපසම්පදාව ඇති කිරීමෙන් පසු එවකට පහත්යැයි සම්මත කුලවලින් සසුන්ගත වූ භික්ෂූන්ට උපසම්පදාව නොදීමේ ආඥාවක් පනවන ලදැයි සමකාලීන කෘතියක් වූ **මන්දාරම්පුර පුවතෙහි** සඳහන් වේ.[2] යට සඳහන් අන්දමට එවකට පහත් යැයි සම්මත කුලවලට අයත් භික්ෂූත්වහන්සේලාට සියම් නිකායෙහි උපසම්පදාව තහනම් කරන ලද්දේ ප්‍රව්‍රජ්‍යා, භූමියට ඇතුළත්ව සිටි, එම කුලවලට අයත් භික්ෂූන් එකල ගිහි සමාජයේ පැවති කුල රටාවේ චාරිත්‍ර ධර්ම අනුව කටයුතු කරගෙන යන බව කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් දළදා මැදුරට රැස්කරන ලද, සංඝරාජ මාහිමියන් සහ දෙවෙහෙර මහ සඟන ඇතුළත් වූ සංඝ සභාවක දී අනාවරණය වූ හෙයිනි.[3]

මෙම සංඝ සභාවේ දී පහත් යැයි සම්මත කුලවලට අයත් නැටුම් සතර දත්, රුහුණු ගිරුවා පත්තුවේ භික්ෂූන් බෙර දවුල් බැඳ නටන පුවතක් අනාවරණය වී තිබේ.[4] එසේම, පැරණි වැඩ වසම් ක්‍රමය අනුව දකුම්කත් ගෙනයන භික්ෂූහු ද සිටියහයි එහි දී අනාවරණය වී ඇත.[5] කදමලු ගෙනයාම පමණක් නොව රෙදි ඇපිල්ලීම පවා කරන ලද භික්ෂූන් ද සිටි බව යථෝක්ත සංඝ සභාවේ දී ප්‍රකාශ විය.[6] මේ හේතු පදනම් කරගනිමින් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා එවකට පහත් කුලවලට පැන වූ උපදම්පදා තහංචිය නිසා භික්ෂු ශාසනයේ අපේක්ෂාකළ අනාගත දියුණුව

එලෙසින් ම ඉටු වී ඇද්දැයි විමසා බැලිය යුතුව ඇත. එවකට පැවිදි ජීවිතය කෙලසී තිබුණේ කුලය අනුව හීනමානයෙන් පීඩිත වූ භික්ෂූන්ගේ අලජ්ජී. ශ්‍රමණ සාරූප්‍ය නොවූ ක්‍රියා නිසා පමණක් නොව, එකල කුල විශේෂයකින් තොරව පොදුවේ ගත් කල උස් පහත් යන හැම කුලයකට ම අයත් බොහෝ භික්ෂූන් වහන්සේලා උපසපන් පැවිදි ජීවිතයකට සම්පූර්ණයෙන් ම පටහැනි, ගිහියන්ට අයත් වූ ලෞකික කටයුතුවල නිරතවීමෙන් භික්ෂු ශාසනය කිලිටි බවට පත් කළහයි මාතර දිසාවෙහි විසූ සියම් නිකායට අයත් වෑගේගොඩ ධම්මකුසල නැමැති භික්ෂූන් වහන්සේ නමක් විසින් කිර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ මැදිහත්වීමෙන් ශාසන විශෝධනයක් කිරීමේ අපේක්ෂාවෙන් වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි ඇතුළු මල්වතු කාරක සංඝසභාව වෙත යවන ලද **වෑගේගොඩ සංදේශයෙන්** අනාවරණය වේ. මෙය පාලියෙන් ලියා ඇත.[7]

පහතරට ප්‍රදේශවල වෙසෙන හීන කුලවලට අයත් භික්ෂූන් වහන්සේලා පමණක් නොව, ඕලන්ද ආණ්ඩුව පැවති සමයේ කුල වෙසෙසක් නොමැතිව පහතරට විසූ භික්ෂූන් වහන්සේලාගේ, මහණදමින් මුළුමනින් ම වෙනස් වූ පැවිදි ජීවිතයේ තතු **වෑගේගොඩ සංදේශයෙහි** විස්තර වී ඇත.[8] ඒ අනුව කුලවාදයෙන් පහතරට භික්ෂු ජීවිතයේ එක් පැත්තක් පමණක් නොඅසා එකල පොදුවේ පහතරට භික්ෂු ජීවිතය කෙලෙසී තිබූ අන්දම **වෑගේගොඩ සංදේශයෙන්** හෙළිදරව් කොට තිබෙන බව පැහැදිළි ය. මෙනයින් බලනවිට සියම් නිකාය පිහිටුවීමෙන් පසු කුලය පදනම් කර ගෙන එවකට පහත් යැයි සම්මත කුලවලට අයත් භික්ෂූන්ට උපසම්පදාව නොදෙන ලෙස පනවා තිබූ රාජ නියෝගයේ සාධාරණත්වයක් ඇතැයි කිව නොහැකි වෙයි. ඉහත කී පහත් කුල තහංචිය නිසා සියම් නිකායේ උපසපන්වීමේ වරම් නොලත් රුහුණෙන් සසුන්ගතව සිටියෝ උපසම්පදාව සහිත අංග සම්පූර්ණ පැවිදි ජීවිතයක් ගත කිරීමේ අපේක්ෂාවෙන් වෙනත් විකල්පයක් සෙවීමෙහි නිරත වූහ.

**අමරපුර නිකායෙහි** ආදී කර්තෘ වහන්සේ වූ අඹගහපිටියේ ඥානවිමලතිස්ස නාහිමියන් සහ උන්වහනසේගෙන් ප්‍රභවය වූ භික්ෂු පිරිස අයත් වූයේ සලාගම කුලයට ය.[9] අඹගහපිටියේ ඥනවිමලිතිස්ස හිමියන් වැලිවිට සංඝරාජ හිමියන්ගෙන් පැවිද්ද ලැබූ නමුත් උන්වහන්සේට උපසම්පදාව ලැබී නැත.[10] නව උපසම්පදාවක් සොයා සියම් දේශය බලා යාමට උන්වහන්සේට සිදුවූයේ එම හේතුව නිසා ය.[11] මෙහි අනිවාර්ය ප්‍රතිඵලය වූයේ ලක්දිව දකුණු පලාත කේන්ද්‍ර කොට ගෙන 1803 දී අඹගහපිටියේ ඥානවිමලතිස්සහිමියන්ගේ පුරෝගාමීත්වයෙන් යුතුව සියම් නිකායෙන් පරිබාහිරවූ **අමරපුර නිකාය** නමින් නව භික්ෂු නිකායක් බිහිවීම ය.[12] සියම් නිකායෙහි උපසම්පදා වරය අහිමි වූ පහත් යැයි සම්මත කුලවලට අයත් වූවෝ සසුන්ගත වී සම්පූර්ණ පැවිදි ජීවිතයක් ගතකිරීමට මෙවැනි වෙනත් විකල්පයක් සෙවීමෙහි නිරත නොවූවාහු නම් කුලවාදය ඇතුළත්ව තිබූ සංඝ සාසනයෙහි පමණක් නොව, සමස්ත බුද්ධ ශාසනයෙහි ම බලවත් පරිහානියක් අනිවාර්යෙන් ම සිදුවීමට හොඳින් ම ඉඩකඩ සැලසී තිබිණ. මක්නිසා ද යත්, එකල වන විටත් උපසම්පදව අහිමිවීම නිසා කලකිරීමට පත් ඇතැම් බෞද්ධ භික්ෂූහු බුදුසමය අතහැර කතෝලික ආගම වැළඳගැනීමට පෙළඹී තිබීම එයට හේතුවයි.[13] සලාගම කුලයට අයත් භික්ෂූන් වහන්සේලා විසින් අමරපුර නිකාය පිහිටුවා ගැනීමෙන් අනතුරුව පහතරට බලවත් වූ පහත් යැයි සම්මත කුල වෙනුවෙන් ද, අමරපුර නිකායේ ශාඛා වශයෙන් තවත් අතුරු නිකාය කීපයක් පිහිටුවා ගන්නා ලදී.

**අමරපුර නිකායේ දඬලු ශාඛාව** මෙවැන්නකි. කලින් සියම් නිකායේ පැවිදිව සිටි ක්පුගම ධම්මක්ඛන්ධ තෙරණුවන් විසින් බුරුම රටින් උපසම්පදාව ලබාගෙන අමරපුර නිකායේ දඬලු ශාඛාව පිහිටුවන ලදී.[14] කතළුවේ ගුණරතනතිස්ස මාහිමියන් වහන්සේ විසින් පිහිටුවා ගන්නාලද අමරපුර නිකායේ **කල්‍යාණිවංශ නිකාය** ද ඉහත කී ආකාරයෙන් බිහි වූ තවත් නිකායකි. කතළුවේ ගුණරතනතිස්ස හිමියන් කරාව වංශිකයෙකි.[15] අත්තුඩාවේ ශ්‍රී ධම්මරක්ඛිත මාහිමියන් වහන්සේ විසින් පිහිටුවා ගන්නා ලද **අමරපුර ධම්මරක්ඛිත නිකාය**. අමරපුර නිකාය ඔස්සේ කුල ක්‍රමය අනුව ආරම්භ කරන ලද තවත් ශාඛාවකි.[16] මේ පිළිවෙතෙහි ම පිහිටා බෝගහපිටියේ ධම්මජෝති මාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් **ලක්දිව උඩරට අමරපුර නිකාය** බිහි විය.[17] මාතර ධම්මාරාම හිමියන් විසින් පිහිටුවා ගන්නා ලද **මාතර නිකාය**. හෙවත් **සද්ධම්මයුක්තික නිකාය** යනුවෙන් හැඳින්වූයේ ද අමරපුර නිකායේ මෙබඳු ම ශාඛාවකි.[18] මේ පිළිවෙත අනුගමනය කරමින් තම ගම් ප්‍රදේශය මුල් කොටගෙන එකම නිකායෙහි අතුරු ශාඛාවන් පිහිටුවා ගැනීමේ ක්‍රමය වර්තමානයේ ද දක්නට ඇත. ඒ අනුව දකුණු පළාත මුල් කොට ගෙන 1986 දී පිහිටුවා ගන්නා ලද සියම් නිකායට අයත් **ශ්‍රී රෝහණ පාර්ශවය** එක් නිදසුනකි.

මෙබඳු ආගමික පසුබිමක් යටතේ අමරපුර නිකාය සහ එහි ශාඛාවන් පිහිටුවා ගැනීම නිසා භික්ෂු ශාසනයෙහි කුලවාදය තවදුරටත් තහවුරුවීමක් සිදු වුවත්, සියම් නිකායේ ආගමික නායකත්වය හමුවෙහි පහතරට පෙදෙස්වල මුළුගැන්වී සිටි පහත්යැයි සම්මත කුලවලට හිමි වූ මෙම ආගමික වරප්‍රසාදය හේතුවෙන් තත් ප්‍රදේශවල ආගමික වශයෙන් නව ප්‍රබෝධයක් ඇති විය. මේ ආගමික ප්‍රබෝධය දහනව වන සියවසේ දෙවන භාගයේ දී දිවයිනේ ඇති වූ ජාතික බෞද්ධ පුනරුද ව්‍යාපාරයට මහත් රුකුලක් වුවා පමණක් නොව විවිධ අන්දමින් ඊට දායක වූ පැවිදි පඬිවරු කීප දෙනෙක් බිහිකිරීමට ද හේතුකාරක විය. ඒ අනුව දොඩන්දුවේ පියරතනතිස්ස, මොහොට්ටිවත්තේ ගුණානන්ද යන හිමිපාණන් වහන්සේලා[19] මෙරට ජාතික, ආගමික ප්‍රබෝධයේ නායකයන් බවට පත්වූයේ සියම් නිකායෙහි උපසම්පදා වරය අහිමි වූ පහත් යැයි සම්මත කුලවලට අයත් වුවන් විසින් පිහිටුවා ගන්නා ලද අමරපුර නිකාය හේතුවෙනි.

භික්ෂු සංස්ථාව කුලීන සංස්ථාවක් බවට පත්කරලීමට සියම් නිකාය දරූ ප්‍රයත්නය අමරපුර නිකාය බිහිවීමත් සමග වෙනසකට භාජනය විය. එයට හේතු වූයේ අමරපුර නිකාය පිහිටුවා ගැනීමෙන් පසු සංඝ සංවිධානය යනු, බුදුන් වහන්සේ විසින් අනුදැන වදාළ අන්දමට සියළුම කුලවලට අයත් වූ පිරිස් සඳහා පොදු සංවිධානයක් විය යුතු බව පෙන්වා දෙන ලද හෙයිනි. එවකට අමරපුර නිකායෙහි සලාගම, කරාව. ගොවිගම, දුරාව යන කුලවලට අයත් පිරිස් පැවිදි වී සිටි බව එම නිකායෙහි ලංකාගොඩ ධීරානන්ද හිමියන් විසින් 1860 දී බුරුම රට ඤෙයාධම්ම සංඝරාජ වහන්සේ වෙත යැවූ පාලි සංදේශයක විස්තරකර තිබීමෙන් එය පැහැදිලි වේ.[20] එසේම අමරපුර නිකායෙහි අතුරු නිකායන් පිහිටුවීමේ දී කුල වෙසෙසක් නැතිව ඒ ශාඛාවන්ට අයත් ප්‍රදේශවල ප්‍රභූවරයන්ගේ අනුග්‍රහය නොමඳව ලැබී තිබීමෙන් ද මෙය වැඩි දුරටත් පැහැදිලි වේ. බෝගහපිටියේ ධම්මජෝති හිමිපාණන් විසින් අමරපුර නිකායේ උඩරට ශාඛාව පිහිටුවීමේ දී ඒ සඳහා අනුග්‍රහ දක්වා ඇත්තේ රදළ කුලයට අයත් මහවලතැන්න, එක්නැලිගොඩ, ඉද්දමල්ගොඩ,

රඹුක්පොත, එල්ලාවල හා ඇලපාත ආදී තත් ප්‍රදේශයෙහි විසූ බෞද්ධ ප්‍රභූවරුන් ය.[21] මෙනයින් බලන විට බුද්ධ ධර්මයෙහි සඳහන් අන්දමට අමරපුර නිකාය විසින් පෙන්වා දෙනලද ජාති කුල භේදවලින් තොර එම ශාසනික සංකල්පය මෙරට සංඝයා වහන්සේලා අතර පමණක් නොව ගිහි බෞද්ධයන් අතර ද පොදු ජාතික හැඟීමක් ඇතිකිරීමට තරම් සමත් විය. අමරපුර නිකාය පිහිටුවීමෙන් පසු එම නිකායේ සංඝයා වහන්සේලා විසින් අනුගමනය කරන ලද ප්‍රව්‍රජ්‍යා, උපසම්පදා ආදී විනය කර්මවල සුපිරිසිදු බව නිසා, ආගමික වශයෙන් ඇති වූ ප්‍රබෝධය වැඩිකල් නොගොස් ම උඩ පහත දෙරටෙහි ම ව්‍යාප්ත වී ගිය බව අමරපුර නිකාය පිහිටුවා වදාළ නාහිමියන් විසින් තත් නිකායට අනුග්‍රහය දක්වනු ලැබූ ප්‍රභූවරයන් වෙත යවනලද ලිපියක සඳහන් වී තිබේ.

> අමරපුර සමාගමේ ධර්මවිනයධර, බහුශ්‍රැත සුපේශල, ශික්‍ෂාකාමී ස්ථවිර ප්‍රමුඛ සංඝයා වහන්සේ විසින් කරන ලද ප්‍රව්‍රජ්‍යා, උපසම්පදා දී විනය කර්ම ප්‍රතිපත්ති ද, ඉතා සුපිරිසිදු යැයි සැබෙවින් පතළා වූ මහත් කීර්ති ඝෝෂාව උඩරට, පහතරට දෙකෙහි ඉතා උසස්ව පැතිරී ගියේ ය.[22]

මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සියම් නිකායෙහි ඇතැම් මහා ස්ථවරයන් වහන්සේලා ප්‍රධාන භික්‍ෂු සාමණේරවරු සිය ගණනක් තම නිකාය අතහැර අභිනවයෙන් පිහිටුවා ගන්නා ලද අමරපුර නිකායේ උපසම්දාව ලබා ඇති බව එම ලිපියෙන් වැඩි දුරටත් අනාවරණය වේ.

> ...ඉන් පසු සිංහලයේ උඩරට සියම් සමාගමේ ශාස්ත්‍රගමධාරී ව්‍යක්ත, මුක්ත නායකාදී ශ්‍රද්ධා බුද්ධිසම්පන්න ලෝකප්‍රසිද්ධ මහා ස්ථවීර ප්‍රමුඛ භික්‍ෂු සාමනේරවරු සිය ගණනක් අමරපුර සමාගමේ ප්‍රව්‍රජ්‍යා, උපසම්පද, දළ්හි කර්මාදිය ලබා ගැනීමෙන් අමරපුර වංශ ප්‍රතිපදාවේ හැසිරෙන්නට පටන් ගත්තේ ය.[23]

ඒ අතර උඩරට ප්‍රසිද්ධ රදළ පවුල්වලට අයත් අලුත්නුවර පඤ්ඤකිත්ති[24] සහ බුලත්ගම ධම්මාලංකාර සිරිසුමනතිස්ස[25] යන හිමිවරු එසේ සියම් නිකාය අතහැර අමරපුර නිකායෙන් උපසම්පදාව ලැබූහ. රාමඤ්ඤ නිකාය පිහිටුවා වදාල අඹගහවත්තේ සරණංකර නාහිමියන් ද මුලින් සියම් නිකායේ පැවිදිව සිට එම නිකාය කෙරෙහි ඇති වූ කලකිරීම නිසා, එම නිකායෙන් ඉවත් වී අමරපුර නිකාය සමග සමීප ඇසුරකට පත්ව බුලත්ගම ධම්මාලංකාර හිමියන් වෙතින් නොයෙක් අනුග්‍රහ ලැබූ කෙනෙකි.[26] මෙනයින් බලන විට සියම් නිකායික උසස් යැයි සම්මත කුලවලට අයත් සංඝයා වහන්සේලා පවා අමරපුර නිකායට ඇතුළත් වුයේ සමාරම්භයේ දී ම පිරිසිදු විනය මුල්කොට ගෙන අමරපුර නිකාය ඔස්සේ බිහි වූ ආගමික ප්‍රබෝධය හේතුවෙනි.

මෙබඳු ජාතික හා ආගමික ප්‍රබෝධයක් ඇති කරමින් වර්ධනය වූ අමරපුර නිකාය දිවයිනේ බ්‍රිතාන්‍ය පාලකයන් සමග ක්‍රියාකරන ලද ආකාරය දෙස බැලීමේ දී අලුතින් පිහිටුවා ගත් අමරපුර නිකායත්, මෙරට ඉංග්‍රීසි පාලනයත් අතර මුල දී දැඩි සබඳතාවයක් පැවති බව පෙනේ. එවකට ආණ්ඩුකාර ධුරය හෙබවූ රොබර්ට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාර තුමා අමරපුර නිකාය පිහිටුවා වදාළ අඹගහපිටියේ ඥානවිමලතිස්ස හිමියන්ගේ අවසරයක් නොමැතිව පහතරට ප්‍රදේශයේ කිසිවකු

පැවිදි නොකළ යුතු යැයි නියෝගයක් ද පනවා තිබේ.[27] තව ද උන්වහන්සේගේ නායක පදවිය ස්ථිර කොට 1825 දී අක්ත පත්‍රයක් ද බ්‍රවුන්රිග් ආණ්ඩුකාර තුමා විසින් පිරිනමා ඇත.[28]

අමරපුර නිකායත් ඉංග්‍රීසි පාලකයිනුත් අතර පැවැති මේ සම්බන්ධතාව බිඳ වැටී ගියේ යථෝක්ත නිකාය පිහිටුවා දශක හතරහමාරක් ගතවීමෙන් පසුව දේශීය ජනතාව පීඩාවට පත් කරමින් බ්‍රිතාන්‍ය පාලකයන් විසින් අනුගමනය කරනු ලැබූ බදු ප්‍රතිපත්තිය හේතුවෙනි. එකී බදු ප්‍රතිපත්තිය දේශීය ජනතාව හා ඉංග්‍රීසි පාලකකයන් අතර 1848 දී හටගත් මහජන කැරැල්ලට ද ප්‍රධාන හේතුවක් වී තිබේ. මෙහිදී වයස 18 ත් 60 ත් අතර ගිහි පැවිදි සියලු දෙනාගෙන් බද්දක් අය කිරීමටත්, එම බදු නොගෙවිය හැකි නම් ගෙවීමක් නොලබා රාජකාරී වශයෙන් සතියක් පාරේ වැඩකිරීමටත් ඉංග්‍රීසි පාලකයන් විසින් නියෝග කර තිබූ බව මූලාශ්‍රයන්ගෙන් අනාවරණය වේ.[29]

බ්‍රිතාන්‍ය පාලකයන් විසින් මහජනතාව පීඩාවට පත් කරමින් අනුගමනය කරන ලද මේ බදු ප්‍රතිපත්තියට විරෝධය දක්වීම සඳහා ප්‍රථමවරට ඉදිරිපත් වූයේ අමරපුර නිකායට අයත් නාහිමිපාණන් වහන්සේලා ය. මෙයට විරුද්ධව අමරපුර නිකාය කටයුතු කළ යුතු යැයි දක්වමින් එම නිකායේ දඩල්ලේ ධීරානන්ද හිමියන් විසින් අමරපුර නිකායේ නායක හිමිපාණන්ට යැවූ ලිපියක මෙම කරුණ අවධාරණය කර ඇත.[30] මේ බදු ප්‍රතිපත්තියේ මූලික අංගයක් වූ ඇඟ බද්ද පිළිබඳව මහජනයාට කරුණු අවබෝධ කිරීම සඳහා යටත් විජිත ලේකම්තුමා ගාල්ලට පැමිණෙන බැවින් එම අවස්ථාවේ අමරපුර නිකායට අයත් නාහිමිවරුන් ප්‍රමුඛ සංඝයා වහන්සේලා ගාල්ලේ කච්චේරියට පැමිණිය යුතු බව සඳහන් කරමින් එම නිකායේ බුලත්ගම ධම්මාලංකාර සිරිසුමන තිස්ස නාහිමියන් විසින් සමස්ත අමරපුර නිකායේ භික්ෂූන් වෙත ලිපියක් යවමින් දන්වා තිබේ.[31]

අමරපුර නිකායට අයත් සංඝයා වහන්සේලා යථෝක්ත අන්දමට බ්‍රිතාන්‍ය පාලකයන් විසින් පනවන ලද බදු ප්‍රතිපත්තියට විරෝධය දක්වීම සඳහා පෙරමුණු ගැනීම හේතුවෙන් එවකට මහජනයා තුළ කෙතරම් දුරට අධිරාජ්‍ය විරෝධී හැඟීම් කුළු ගැන් වී ගියේදයත් බදු සම්බන්ධව කරුණු පැහැදිලි කිරීමට පැමිණි යටත් විජිත ලේකම්තුමා ගාල්ලේ වැසියන් විසින් පළවා හරින ලද බව ද සඳහන් වේ.[32] ඒ අනුව අමරපුර නිකාය ඔස්සේ ඇති කරන ලද ජාතික ප්‍රබෝධය පහත රට ජනතාව තුළ අධිරාජ්‍ය විරෝධි හැඟීම් කුළු ගැන්වීමට මහෝපකාරී වී තිබෙන බව පැහැදිලි ය.

අමරපුර නිකයා ඔස්සේ ඇති කරන ලද ජාතික හා ආගමික ප්‍රබෝධය වඩාත් කැපී පෙනෙන්ට වූයේ දහනව වන සියවසේ දෙවන භාගයේ දී ක්‍රිස්තියානි මිෂනාරිවරුන් විසින් මුද්‍රණයන්ත්‍රාල මාර්ගයෙන් මෙරට කරගෙන ගිය ක්‍රිස්තියානි ධර්මය පතුරවා හැරීමේ ව්‍යාපාර යේ දී ය. ක්‍රිස්තියානි මිෂනාරීන් විසින් මුද්‍රණයන්ත්‍රාල මාර්ගයෙන් ක්‍රිස්තියානි ධර්මය පතරුවා හැරීම සඳහා එම ධර්මය පිළිබඳව විවිධ කරුණු එළිදරව් කරමින් බුදු දහමට පහරදීමේ අරමුණින් යුතුව ලියැවුණු ක්‍රිස්තියානි සාහිත්‍යක් දහනව වන සියවසේ මුල් භාගයේ සිට ම දිවයිනේ පතුරුවා

හරින ලදී.[33] මීට අමතරව මිෂනාරීන් විසින් ඉහත පරමාර්ථයෙන් යුතුව තවත් ක්‍රියා මාර්ග දෙකක් මුද්‍රණ ශිල්ප ඔස්සේ සිංහල බෞද්ධ සමාජයට හඳුන්වා දෙන ලදී. ඒවා නම් පුවත්පත් හා සඟරා ය.[34]

මිෂනාරිවරුන් විසින් යොදාගන්නා ලද මේ ප්‍රචාරක මාධ්‍යයෙන් ම ඔවුන්ට නිසි පිළිතුරුදීම සඳහා බෞද්ධයන් වෙනුවෙන් මුද්‍රණාලයක් පිහිටුවීමේ අවශ්‍යතාවය ප්‍රථමවරට වටහා ගනු ලැබූවේ අමරපුර නිකායේ බුලත්ගම ධම්මාලංකාර සිරිසුමනතිස්ස නාහිමියන් විසිනි. උන්වහන්සේ විසින් සියම් රජතුමාගෙන් පරිත්‍යාග මුදලක් ලබා ගෙන 1862 දී **ලංකෝපාකාරය** නමින් මුද්‍රණාලයක් ගාල්ලේ අරඹන ලදී.[35] මේ මුද්‍රණාලය දිවයිනේ බෞද්ධයන්ට අයත් වූ ප්‍රථම මුද්‍රණාලය විය.[36] එය ඇරඹීමේ කාර්යයට තත් නිකායට අයත් දොඩන්දූවේ පියරතනතිස්ස හා වැලිගම සිරි සුමංගල යන නාහිමිවරු ද දායක වූහ.[37] බෞද්ධයන් සතු වූ ප්‍රථම පුවත්පත වූ **ලංකාලෝකය** මෙහි මුද්‍රණය කරන ලදී.[38] මෙනයින් බලනවිට මිෂනාරි පක්ෂයෙන් හා මුද්‍රණ ශිල්පයේ මාර්ගයෙන් බෞද්ධ භික්ෂුවට සහ බුද්ධ ධර්මයට එල්ල වූ ප්‍රහාරවලට එම මාධ්‍යයෙන් ම පිළිතුරුදීම සඳහා ප්‍රථමවරට අමරපුර නිකායේ සංඝයාවහන්සේලා පුරෝගාමී වී තිබෙන බව පැහැදිළි ය. දහනව වන සියවස දෙවන භාගයේ දී මුද්‍රණ ශිල්පය සිංහල බෞද්ධයන් අතට පත් වීම අමරපුර නිකාය ඔස්සේ ඇති වූ ජාතික හා ආගමික ප්‍රබෝධයෙන් ලත් වැදගත් ප්‍රතිඵලයක් විය.

අමරපුර නිකාය ඇසුරෙන් බිහි වූ ජාතික හා ආගමික ප්‍රබෝධයෙහි සුවිශේෂ වර්ධනයක් ඇති කරන ලද්දේ තත් නිකායේ ශාඛාවක් වූ **අමරපුර කල්‍යාණිවංශ** නිකාය මගිනි. මේ නිකායෙහි ආදී කර්තෘවරයාණන් වුයේ කතළුවේ ගුණරතනතිස්ස නාහිමියන් ය. ගුණරතන තිස්ස නාහිමියන් රාමඤ්ඤ දේශයේ කල්‍යාණිවංශයෙන් උප සම්පදාව ලබා දිවයිනට පැමිණ 1810 දී මෙම නිකාය පිහිටුවා ඇත. උන්වහන්සේ රාමඤ්ඤ දේශයේ කල්‍යාණිවංශයෙන් ලබන ලද මේ උපසම්පදාව දේශීය වටිනාකමකින් යුක්ත වුවකි. උන් වහන්සේ විසින් ලැබූ යථෝක්ත උපසම්පදාව වඩාත් වැදගත් වනුයේ හයවන බුවනෙකබාහු රජුගේ (1469-1477) රාජ්‍යාදයේ දී මෙරටින් ගෙන ගොස් පිහිටුවන ලද එකක් වූ හෙයිනි.[40]

ලංකාගොඩ ධීරානන්ද හිමියන් විසින් මාදුගගේ උදකුක්ඛේප සීමාවෙහි සිදුකරන ලද උපසම්පදා කර්මය, නිසා විනය පිළිබඳ ප්‍රශ්නයක් මුල්කරගෙන අමරපුර නිකාය තුළ ඇති කළ සීමාසංකර වාදය[41] නිසා අමරපුර කල්‍යාණිවංශ නිකායේ කැපී පෙනෙන ප්‍රගතියක් ඇති කිරීමට සමත් විය. සීමාසංකර වාදයෙන් පසු අමරපුර නිකායෙත්, අමරපුර මාතර නිකායේත් ඇතැම් භික්ෂුන්වහන්සේලා කල්‍යාණිවංශ නිකාය වෙත ඇදී එන්නට වූහ. එසේ ඇදි ආ ඇතැම් භික්ෂූහු කල්‍යාණිවංශ නිකාය තුළ සමගි සම්මුතියක් ඇති කර ගත්හ. මේ සමගි සම්මුතියට එවකට සුප්‍රසිද්ධ භික්ෂුන් වහන්සේලා අට දෙනෙකු විසින් අත්සන් තබන ලදී, එසේ අත්සන් තැබූ භික්ෂුන් වහන්සේලා අතර රාමඤ්ඤ නිකාය පිහිටුවා වදාල අඹගහවත්තේ සරණංකර මාහිමියෝ ද ඇතුළත් වූහ.[42] අමරපුර කල්‍යාණිවංශ නිකායෙහි සිදු වූ යථෝක්ත ප්‍රගතිය නිසා ජාතික හා ආගමික ප්‍රබෝධයේ වර්ධනයක් ඇති කිරීම සඳහා පුරෝගාමී වූ පැවිදි පඬිවරු කීප දෙනෙක් බිහි විය. ඒ අය අතර දොඩන්දූවේ පියරතනතිස්ස, මොහොට්ටිවත්තේ ගුණානන්ද යන නාහිමිපාණන් වහන්සේලා කැපී පෙනුණි.

අමරපුර නිකාය පිහිටුවීමෙන් පසු ජාතික, ආගමික කටයුතුවල ප්‍රබෝධයක් සිදුවුවත්, එය ඉදිරියට ගෙනයාම සඳහා අත්‍යවශ්‍ය අංගයක් වූ මෙරට බෞද්ධ අධ්‍යාපනයෙහි ප්‍රබෝධයක් සිදු වූ බව නොපෙනේ. මක්නිසාදයත්, දහනව වැනි ශතවර්ෂයේ අවසාන භාගය දක්වා සම්පූර්ණයෙන් ම පාහේ මෙරට අධ්‍යාපනය මිෂනාරි ව්‍යාපාරය යටතේ පවත්වාගෙනයනු ලැබූ හෙයිනි. 1832 කෝල්බෲක් කොමිෂන් සභාව මගින් අධ්‍යාපනයේ වැඩි බලතල ලබාදෙන ලද්දේ ක්‍රිස්තියානි මිෂනාරිවරුන්ට ය. බහුතරය වූ බෞද්ධ දරුවන් සිංහල මාධ්‍යයෙන් ලබන අධ්‍යාපනයට බලවත් පහරක් වූයේ මේ කොමිෂන් සභාවේ නිර්දේශන් අනුව සිංහල පාසල් අවලංගු කිරීමයි.[43] 1869 දී, ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසු මිෂනාරි පාසැල් රජයේ පරීක්ෂණයට එක්තරා ප්‍රමාණයකින් භාජනය වුව ද[44] එයින් බෞද්ධ මහජනතාවට වැඩි යහපතක් වූයේ නැත. මේ මිෂනාරි පාසල් මගින් ඉංග්‍රිසි මාධ්‍යයෙන් දෙන ලද අධ්‍යාපනය ඔස්සේ ක්‍රිස්තියානි ආගමත් බටහිර සංස්කෘතියත් රටපුරා සීඝ්‍රයෙන් පැතිරන්නට විය. ඒ නිසා මිෂනාරි ව්‍යාපාරයේ ග්‍රහණයෙන් මුදවාගත් බෞද්ධ අධ්‍යාපනයක් මේ රටේ බෞද්ධ ජනතාව සඳහා තිබිය යුතු බව එවකට ජාතික ආගමික පුනරුද ව්‍යාපාරය මෙහෙයවන ලද පැවිදි පඬිවරුන්ට අවබෝධ විය.

ඒ අනුව පහතරට කේන්ද්‍ර කොට ගෙන ඇති වූ බෞද්ධ අධ්‍යාපනයේ ප්‍රබෝධයට මුල් පියවර තබන ලද්දේ, අමරපුර කල්‍යාණිවංශ නිකායේ භික්ෂූන් වහන්සේලා විසිනි. කල්‍යාණිවංශ නිකායේ දොඩන්දූවේ පියරතනතිස්ස නාහිමියන් විසින් දිවයිනේ ප්‍රථම බෞද්ධ පාඨශාලාව පිහිටුවන ලදී.[45] මේ බෞද්ධ පාඨශාලාව **ජිනලබ්ධිවිශෝධක** නමින් දොඩන්දූවේ ශෛලබිම්බාරාමය අසල ගොඩනගන ලද්දේ 1869 දී ය.[46] එසේ ම පානදුරේ උපාධ්‍යාය බෞද්ධ පාඨශාලාව ද පිහිටුවන ලද්දේ උන්වහන්සේගේ උත්සාහයෙනි.[47]

තත්කාලපරිච්ඡේදයේ දී අමරපුර කල්‍යාණිවංශ නිකායේ නායක පදවියට පත් වූ උඩුගල්පිටියේ සිරිසුමනතිස්ස, අලුත්ගම ශ්‍රී සීලක්ඛන්ධ යන නාහිමිපාණන් වහන්සේලා ද එවකට බෞද්ධ අධ්‍යාපනයෙහි ඇති වූ ප්‍රබෝධයට දායක වූහ. උන්වහන්සේලා විසින් දොඩන්දූවේ ශෛලබිම්බාරාම විහාරස්ථානය කේන්ද්‍ර කොට ගෙන බෞද්ධ අධ්‍යාපනයෙහි ප්‍රබෝධය තව දුරටත් වර්ධනය කරන ලදී[48] මෙනයින් බලන විට ඕල්කට්තුමාගේ ලංකාගමනයට පෙරාතුව ම දිවයිනේ බෞද්ධ අධ්‍යාපනයෙහි ප්‍රබෝධයක් ඇති කිරීම සඳහා පුරෝගාමී වූයේ අමරපුර කල්‍යාණිවංශ නිකායේ පැවිදි පඬිවරුන් බව පෙනේ.[48]

දහනව වන සියවසේ ලක්දිව බෞද්ධ අධ්‍යාපනයෙහි සිදු වූ ප්‍රබෝධයට තදනන්තරව අමරපුර කල්‍යාණිවංශ නිකාය ධර්මශාස්ත්‍ර දෙකෙහි ප්‍රබෝධයක් ඇති කිරීම සඳහා ද පුරෝගාමී විය. එම අවධියේ දී විශාරද පැවිදි උගතුන් බිහිකිරීම අතිනුත්, පහතරට ප්‍රදේශයෙහි ඇති කරන ලද ධර්ම ශාස්ත්‍රාලෝකය අතිනුත් අමරපුර කල්‍යාණිවංශ නිකායට අයත් වූ දොඩන්දූවේ ශෛලබිම්බාරාම විහාරස්ථානයට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි.

කල්‍යාණිවංශ නිකායේ දොඩන්දූවේ පියරතනතිස්ස නාහිමියන් සමකාලීන පඬිවරුන් අතර කීර්තිමත් පඬිවරයෙකු වශයෙන් ප්‍රසිද්ධියට පත්ව සිටියේ ය. එකල බෞද්ධ අධ්‍යාපනය සඳහා

ලිහිල් බසින් රචිත දහම් පොත් අවිද්‍යමාන වූ බැවින් උන්වහන්සේ විසින් ඒ සඳහා **ශ්‍රේයාර්ථදීපනී ජිනධම්මිකාශිති** යන ධර්ම ග්‍රන්ථ සම්පාදනය කරන ලදී.[49] තවත් ධර්ම ග්‍රන්ථ කීපයක් පියරතනතිස්ස හිමියන් විසින් සම්පාදනය කරන ලදී. ඒ අතර, උන්වහන්සේ විසින් ධර්ම විනය සම්බන්ධව ලියන ලද **විනය නීති** නැමැති ග්‍රන්ථය වැදගත් කෘතියකි.[50]

දෙඩන්දූවේ පියරතනතිස්ස නාහිමියන්ගේ ඇවෑමෙන් කල්‍යාණිවංශ නිකායේ නායක පදවිය හෙබවූ අලුත්ගම සීලක්ඛන්ධ මාහිමියන් වහන්සේ සංස්කෘත භාෂාවෙහි ගැඹුරු දැනීමක් ඇතිව සිටි පඬිවරයෙකි. **සද්ධම්මකරන්ඩ, රාජරාජේශ්වරප්‍රශස්ති, ශ්‍රී මංගලාෂ්ටක, වරමංගලාෂ්ටක** යන කෘතීන් උන්වහන්සේගේ සංස්කෘත භාෂා ඥානය හෙළි කරන කෘතීහු වෙති.[51] අමරපුර කල්‍යාණිවංශ නිකායට අයත් වූ වැලිපටන්විල දීපංකර හිමියන් විසින් දොඩන්දූවේ තරුණ බෞද්ධ සමිතිය පිහිටුවා ලීමෙන් ද, ඉරුදින පාඨශාලා පැවැත්වීමෙන් ද, **මයූර සංදේශ සත්තය, පාරමී ශතක සත්තය** ආදී ග්‍රන්ථ සම්පාදනය කිරීමෙන් ද, පහතරට ඇති වූ ධර්ම ශාස්ත්‍ර ප්‍රබෝධයට ඉමහත් සේවාවක් කරන ලදී.[52] මෙනයින් බලන විට අමරපුර කල්‍යාණිවංශ නිකායෙන් ඇති වූ ධර්ම ශාස්ත්‍ර ප්‍රබෝධය පහත රට ප්‍රදේශයෙහි ශාස්ත්‍රාලෝකය පැතිරවීමට උපස්තම්භක විය.

දහනව වන සියවස දෙවන භාගයේ දී ක්‍රිස්තියානි පක්ෂයෙන් බෞද්ධ භික්ෂුවට සහ බුද්ධ ධර්මයට එල්ල වූ තද බල වාග් ප්‍රහාරවලට පිළිතුරුදීමට බෞද්ධ භික්ෂූන් වහන්සේලාට සංවිධානය වීමට සිදු විය. එහි දී ප්‍රමුඛස්ථානයක් ගනු ලැබුවේ අමරපුර කල්‍යාණිවංශ නිකායට අයත් පැවිදි පඬිවරයෙකු වූ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිපාණන් වහන්සේ ය. එවකට මිෂනාරිවරුන් ගෙන ගිය ප්‍රචාරවලට නිසි පිළිතුරුදීම සඳහා ප්‍රසිද්ධ වේදිකාවල දී ක්‍රිස්තියානින් සමඟ ප්‍රසිද්ධ වාද පැවැත්වීමට බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඉදිරිපත් වුයේ උන්වහන්සේගේ මූලිකත්වයෙනි. ක්‍රිස්තියානි බලය සෑහෙන දුරට පරාජය කිරීමට සමත් වූ ප්‍රධාන ආගමික වාද හතරක් ගුණානන්ද හිමියෝ මිෂනාරින් සමඟ පැවැත්වූහ. මේ ආගමික වාදයන් හතර බද්දේගම (1865) උදන්විට (1866), ගම්පොළ (1871) හා පානදුරය (1873) යන ස්ථානවල දී පවත්වා ඇත. මෙබඳු වාද පැවැත්වීමෙන් සාමාන්‍ය ජනතාව තුළ භික්ෂූන් වහන්සේ කෙරෙහි හා බුද්ධ ධර්මය කෙරෙහි වැරදි අවබෝධයක් ඇති කරවන දුර්මත බිඳහෙළීමට සමත් විය. මේ වාදවල දී දුර්මතයන්හි එල්බ සිටි බෞද්ධ ජනතාව පැහැදවීමෙන් මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියෝ දිවයිනේ ජාතික ආගමික ප්‍රබෝධයේ උද්දීපනයක් ඇති කිරීම සඳහා පුරෝගාමීව ක්‍රියා කළහ.

දහනව වන සියවසේ අවසාන භාගයේ දී ජාතික බෞද්ධ පුනරුද ව්‍යාපාරයේ නව ප්‍රවණතා ඇතිකිරීම කෙරෙහි බෙහෙවින් බල පෑ කර්නල් ඕල්කට්තුමාගේ ලංකාගමනය සිදුවූයේ ද ගුණානන්ද හිමියන් විසින් 1873 දී පවත්වන ලද පානදුර වාදය හේතුවෙනි.[53] එතුමා ලංකාවට සැපත්වීමට පෙර සිට ම ඔහු සමඟ සම්බන්ධතා ගොඩනගා ගත් මෙරට බෞද්ධ භික්ෂූන් වහන්සේලා අතර අමරපුර කල්‍යාණිවංශ නිකායට අයත් දොඩන්දූවේ පියරතනතිස්ස හා මොහොට්ටිවත්තේ ගුණානන්ද යන හිමිපාණන් වහන්සේලා ප්‍රමුඛත්වය ගෙන ඇත.[54] ඕල්කට්තුමා දිවයිනට පැමිණීමෙන් පසු ආරම්භ කරන ලද ජාතික හා ආගමික ව්‍යාපාරයේ

එතුමන් සමග පුරෝගාමීව කටයුතු කරන ලද්දේ ද මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් ය.[55] මේ අවධියේ දී විශේෂයෙන් මිෂනාරිවරුන් බෞද්ධ භික්ෂුවට හා බුද්ධ ධර්මයට විරුද්ධව ප්‍රචාරක කටයුතු ගෙන යාම සඳහා ප්‍රබල මාධ්‍යයක් වශයෙන් උපයෝගී කොට ගන්නා ලද්දේ පුවත්පත් හා සඟරාවන් ය.

බෞද්ධ විරෝධී ප්‍රචාරක කටයුතුවල දී ක්‍රිස්තියානි පක්ෂයට පිළිතුරු වශයෙන් බෞද්ධ පැත්තෙන් පුවත්පත් හා සඟරා මුද්‍රණය කිරීම සඳහා නායකත්වය සපයන ලද්දේ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන් විසිනි. මේ වනවිට ගාල්ලේ පිහිටුවා තිබූ **ලංකෝපකාර බෞද්ධ මුද්‍රණාලය** මේ සඳහා ප්‍රමාණවත් නොවන බව වටහා ගත් උන්වහන්සේ බෞද්ධයන් වෙනුවෙන් තවත් මුද්‍රණාලයක් පිහිටු විය. 1862 දී පිහිටුවනු ලැබූ එය **සර්වඥශාසනාභිවෘද්ධිදායකධම්ම මුද්‍රණාලය** නම් විය.[53] අමරපුර නිකායේ පුරෝගාමීත්වයෙන් පිහිටුවන ලද දෙවෙනි බෞද්ධ මුද්‍රණාලය මෙය විය. එම බෞද්ධ මුද්‍රණාලය මගින් **දුර්ලබ්ධිවිනෝදනිය**, **ක්‍රිස්තියානි වාදමර්ධනය**, **සම්‍යක්දර්ශනය**, **සත්‍ය මාර්ගය හා සද්ධර්ම සංග්‍රහය** යන බෞද්ධ පුවත්පත් හා සඟරා පළකරමින්[57] ක්‍රිස්තියානි පක්ෂයට බලවත් ප්‍රහාරයක් එල්ල කොට ඇත.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් පනවන ලද ඇතැම් නියෝග නිසා උපසම්පදාව ලද නොහැකි වූ එවකට පහත් යයි සම්මත කුලවලට අයත්යයි සැලකුණු පැවිද්දෝ තමන්ගේ ස්වාධීනත්වය සහ අනන්‍යතාව රැකගෙන ආගමික කටයුතු කිරීම සඳහා උත්සුකවීමේ ප්‍රතිඵලය වශයෙන් කුලභේදය පදනම් කරගත් භික්ෂූන්ගේ නිකාය බෙදීමක් දහනව වන සියවස ආරම්භයේ දී පහතරට ඇති විය. ප්‍රථමයෙන් අමරපුර නිකාය වශයෙන් ආරම්භ වී ශාඛා ප්‍රශාඛා වශයෙන් විහිදී ගිය පහතරට භික්ෂු සමාජය තමන්ට එල්ලවූ බටහිර බලවේගයන්ට නිබයව මුහුණදීමට හැකි ප්‍රධාන බලවේගයක් ගොඩනැගීමට ශක්තිමත් පදනමක් වූ ආකාරය මේ විමර්ශනයේ දී පැහැදිලි කිරීමට උත්සාහ දරන ලදී. අමරපුර නිකාය බිහිවීම හා වර්ධනය තුළින් ඉස්මතු වූ ජාතික හා ආගමික ප්‍රබෝධය මෙරට දහනව වන සියවස අගභාගයේ ඇති වූ බෞද්ධ පුනරුද ව්‍යාපාරය බිහිවීම කෙරෙහි බෙහෙවින් උපස්ථම්භකයක් වී ඇති බව පැහැදිලි ය.

## සටහන්

01. කුලතුංග, ටී. ජී., සමස්ත ලංකා අමරපුර මහා නිකාය, අමරපුර නිකාය බිහිවීම පිළිබඳ වැඩි විස්තර සඳහා බලන්න. වන්දිම විජේඛණ්ඩාර සංස්කරණය, ශ්‍රී චන්ද්‍රමුණි ආශිර් ලේඛා, කොළඹ, 1985, 11.21, පිටු.

02. මන්දාරම් පුවත. සංස්. ලබුගම ලංකානන්ද හිමි, කොළඹ, 1958, 107 පටුව 860 කවිය.

03. එම, 106 පිටුව, 842, 843, 850, 851 කවි.

04. එම, 832 කවිය.

05. එම, 834 කවිය.

06. එම, 848 කවිය.

07. හේවාවසම්, ප. බ. ජී.. මාතර යුගයේ සාහිත්‍ය ධරයන් හා සාහිත්‍ය නිබන්ධන, කොළඹ, 1966, උප ග්‍රන්තය, කිර්ති ශ්‍රී රාජසිංහ මහරජානන්ට ඔප්පු කරන ලද වගේගොඩ ස්ථවිරයන්ගේ පාලි සංදේශය, 517-518 පිටු.

08. එම, 517-518, 1-24 ගාථා.

09. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, *සම්පාතීතයෙහි බෞද්ධචායර්යෝ*. අම්බලන්ගොඩ, 1950, 52 පිටුව.

10. එම, 21-22 පිටු.

11. එම.

12. එම, 24 පිටුව.

13. වාචිස්සර හිමි, කොටගම, *සරණංකර සංඝරාජ සමය*, 1960, 42 පිටුව.

14. *සම්පාතීයෙහි බෞද්ධාචායර්යෝ*, 28 පිටුව.

15. එම, 33 පිටුව.

16. එම, 39-44 පිටු.

17. එම, 45-47 පිටු.

18. එම, 47-50 පිටු.

19. දෙඩන්දූවේ පියරතනතිස්ස, මොහොට්ටිවත්තේ ගුණානන්ද යන නාහිමිපාණන් වහන්සේලා පිළිවෙළින් කරාව සහ සලාගම යන ගෝත්‍රයන්ට අයත් වූහ.

20. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, *පාලි සංදේශාවලිය*, කොළඹ, 1962, 139, පිටුව.

21. පඤ්ඤාසීහ හිමි, මඩිහේ. *බුද්ධවංශ, ශාසනවංශ, අමරපුරවංශ*, මහරගම. 1980, 164, පිටුව.

22. ශ්‍රී ලංකා ජාතික ලේඛනාගාරය, *5/63/17 (420)*.

23. එම.

24. *සම්පාතීතයෙහි බෞද්ධාචායර්යෝ*, 25 පිටුව.

25. සාසනතිලක හිමි, *මාතලේ, රාමඤ්ඤ වංශය*, කොළඹ, 1964, 33 පිටුව.

26. එම, 31 පිටුව.

27. *සම්පාතීතයෙහි බෞද්ධාචායර්යෝ*, 25 පිටුව.

28. එම.

29. ශ්‍රී ලං. ජා. ලේ. *5/63/47 (62)*.

30. එම.

31. ශ්‍රී ලං. ජා. ලේ. *5/63/47 (25).*
32. විමලරත්න, ව. ආ., *1848 කැරැල්ලේ ස්වරූපය,* ඓතිහාසික ලේඛන සංග්‍රහය, කැලණිය, 1964, 54 පිටුව.
33. කාරියවසම්, තිස්ස, මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණෝ, පසුබිම සහ කාර්ය සාදනය, තිස්ස කාරියවසම්, ප්‍රනීත් අභයසුන්දර සංස්කරණය, *මොහොට්ටිවත්තේ ශ්‍රී ගුණානන්ද සමරු කලාපය,* මහරගම. 1990, 192 පිටුව.
34. එම, 193 පිටුව.
35. ගාල්ලේ ලංකෝපකාර අච්චු කන්තෝරුව වෙනුවෙන් දැන්වීම් පත්‍රය, 1865, 5 පිටුව.
36. එම.
37. එම, 8 පිටුව.
38. සාසනරතන හිමි, *ශ්‍රී පරමානන්ද මහාවිහාර වංශය.* ගාල්ල, 1993, 30 පිටුව.
39. බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, *කල්‍යාණී ශාසන වංශය,* කොළඹ, 1935, 25 පිටුව.
40. එම, 18, 19 පිටු.
41. *සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ,* 53 පිටුව.
42. *කල්‍යාණී ශාසනවංශය,* 112 පිටුව.
43. *ලංකාවේ අධ්‍යාපනය ක්‍රි. පූ. සවැනි සියවසේ සිට අද දක්වා සියවස ප්‍රකාශනය,* 1 කාණ්ඩය, කොළඹ 1969 පූර්විකා, 111 පිටුව.
44. එම, පූර්විකාව 5 පිටුව.
45. *සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ,* 113 පිටුව.
46. *කල්‍යාණී සාසන වංශය,* 129 පිටුව.
47. එම.
48. එම, 86 122 පිටු.
49. එම, 130 පිටුව.
50. එම.
51. එම, 139 පිටුව.
52. *සමීපාතීතයෙහි බෞද්ධාචාර්යයෝ,* 172, 173 පිටු.
53. ධර්මබන්ධු. ටී. ඇස්., *පංචමහාවාදය.* මරදාන, 1956, පානදුරාවාදයේ සංඥාපනය, පිටුව.
54. කාරියවසම්, තිස්ස, රාමඤ්ඤ නිකායේ ප්‍රභවය හා ව්‍යාප්තිය, හේන්පිටගෙදර ඤාණවාස හිමි හා කෝන්ගස්තැන්නේ ආනන්ද හිමි සංස්කරණය, *අභිඥාව සංග්‍රහය,* කොළඹ, 1976, 24 පිටුව.
55. කාරියවසම්, තිස්ස, 1990, 25 පිටුව.
56. එම. 201 පිටුව.
57. එම.